## සැබෑ සමාජයෙන් වැටෙන ගිණියම් හුස්ම පොද

# ලක්ෂ්මන් කොඩිතුවක්කුගේ "හුස්ම" කෙටිකතා සංග්‍රහය






ජගත් ජේ එදිරිසිංහ

"ගෙවෙන සෑම නිමේෂයක්, නොසිතා බිඹු වදනක්, හෙළූ බැල්මක්, නොදැනෙන සේ ගැහෙන මිනිස් හද ගැස්මක්, පොප්ලර් ගසකින් පතිත වන මටුලු රේණුවක්, ගෙදිගු විලෙක දිලිසෙන තරු කිරණ කණිකාවක්, මේ සියල්ලම රන් සුණු ය. ලේඛකයන් වන අපි චිරාත් කාලයක් යටි හිතෙන් මෙවැනි අනන්ත අප්‍රමාණ රන්සුණු අවුලමු. අවුලා දිනෙක ඒවා ගෙන එකට තලා අපගේම රන් රෝස මලක් නිමවනතෙක් තැන්පත් කොට තබාගෙන සිටිමු. ඒ රන් රෝස මල කථාන්තරයක් නවකතාවක් හෝ නැතහොත් කවක් විය හැකිය. සාහිත ශ්‍රොතස උපදින්නේ මේ අගය නොමිණිය හැකි රන්සුණු වලිනි." රන් රෝස - කොන්ස්ටන්ටයින් පවුස්තවුස්කි (පරිවර්තනය ආරියවංශ රණවීර)

පවුස්තවුස්කි නිවැරදිව කී ලෙසම දහසක් දුක් විඳ මහත් ලොබින් රන්සුණු අසුලන, අසුලා තලා රන්රෝස නිපදවන, ලේඛක පරපුරේ එක් පුරුකක් වන ලක්ෂ්මන් කොඩිතුවක්කු නම් වන අපේ කෙටිකතාකරුවා සිය නවතම කෙටිකතා සංග්‍රහය "හුස්ම" නමින් අපතට පත් කරයි.

සිය අත්දැකීම් රන්සුණු සේ එකතුකර ඒවා පෙර්ෂණය කර නිර්මාණ බවට පත් කරන්නට ලේඛකයකු දරන වෙහෙස අපමණය. ඒ වෙහෙසකර ව්‍යායාමයෙන් අනතුරුව ලක්ෂ්මන් අපට පිරිනමන "හුස්ම" කෙටිකතා සංග්‍රහයේ කෙටිකතා එකොළහකි. හුස්ම, තිලකය, වෙඩි තියාගත්තාට පස්සෙ, එතෙරවීම - ගල් වූ තරුණයකුගේ කතාවක්, සිහින විකිණීමට තිබේ, නිරුවතක් නැති රුවක්, බැමි, ගී ගයන වීරයෙක්, මනාපය, පාට බොඳ වුණු සිහිනයක් සහ ස්වයං ඝාතිකාව ඒ කෙටිකතා එකොළහයි.

අත්දැකීමක් නිර්මාණයක් බවට පෙරළෙන විට එය තමාට අවශ්‍ය ලෙස හැඩ ගසා ගන්නට දක්ෂ නිර්මාණකරුවකුට හැකිය. කෙටි කතා සංග්‍රහයට නම යෙදී ඇති "හුස්ම" කෙටිකතාව යුද්ධයෙන් පසු ශ්‍රී ලංකාව පසුබිම් කරගත් කතාවකි. යුද්ධයේ නිමාවෙන් සතුටට පත්වන පිරිස අතරේ එයින් අසතුටට පත්වන මිනිස්සුද සිටිති. අවමංගල්‍ය සේවා සපයන්නා එවැන්නෙකි. යුද්ධය නිමාව ඔහුගේ ව්‍යාපාරයට වැදුන මරු පහරකි. ව්‍යාපාර ප්‍රවර්ධනය සඳහා ඔහු පුවත්පත් දැන්වීමක් දමා උපාධිධාරියකු සේවයට ගන්නට උත්සාහ කරයි. රැකියා විරහිතභාවයේ ප්‍රතිඵලයක් ලෙස උපාධිධාරියාගේ විවාහය පමා වෙමින් තිබෙයි. කතාව අවසන් වන විට උපාධිධාරියා දකිමින් සිටින සිහිනයේ ඔහුගේ පෙම්වතිය විවාහය පමා වන වේදනාවෙන් සියදිවි හානි කර ගනියි.

"බොඩි එක අපට දෙන්න.. අපි සාධාරණ මුදලකට වැඩේ කරලා දෙන්නං" මුදලාලි සිහිනයෙන්ම උපාධිධාරියාට කියයි.

රැකියා විරහිත උපාධිධාරියා සහ අවමංගල්‍ය සේවයේ මුදලාලි අතර ගොඩ නැගෙන හුස්ම කෙටි කතාව උපහාසය තුළින් ගැඹුරු සමාජ සත්තාවක් අපට පෙන්වා දෙයි. සුදුසුකම් මත රැකියාවක් ලබා ගැනීමේ සිහිනයේ වෙලී සිටින තරුණ පරම්පරාවේ බෙදවාචකය සාර්ථක ලෙස සිය නිර්මාණයට හසු කරගන්නට ලේඛකයා දැක්වූ සමත්කම ඉතා ඉහළය.

"තිලකය" කෙටිකතාව තරුණ කාලයේදී දමිල යුවතියක හා පෙමින් වෙළී සිටියකු කේන්ද්‍ර කරගත් කතාවකි. විදෙස් ගතව ජීවත්වන කතානායකයාගේ පුතා විවාහ වන්නට යන්නේද දමිල යුවතියක සමගින්ය. එතැන් සිට අතීතාවර්ජනයක් ලෙසින් කියැවෙන කතාව කලු පීලියේ අඳුරු මතකය නැවත සිහිපත් කරයි. කතානායකයාට සිය දමිල පෙම්වතිය අහිමිවන්නේ කලු ජූලිය නිසා ය. ඒ විරහ වේදනාව සිය ජීවිත කාලය පුරාවටම දරා සිටිනා කතා නායකයා සිය පුතා දමිල යුවතියක හා එක්වීම අනුමත කරයි. කෝවිලේදී හමුවන පැරණි පෙම්වතියගේ සොහොයුරා වෙතින් සිය නැගණිය කලකට පෙර යාපනයේදී මිය ගිය බව දැනගන්නා කතානායකයා තුළ ඇතිවන කම්පනය ලක්ෂ්මන් මැනැවින් නිර්මාණය කර ඇති බව අපට දැනෙයි.

ගුරුවරයකුගේ මරණය විවිධ පුද්ගලයන්ගේ දෘෂ්ඨි කෝණ තුළින් සාකච්ඡාවට බඳුන් කෙරෙන වෙඩි තියාගත්තාට පස්සෙ කෙටි කතාව "හුස්ම" කෙටිකතා සංග්‍රහයේ අපට කියවන්නට ලැබෙන තවත් සාර්ථක කෙටි කතාවකි. ගුරුවරයා උගන්වන පරමාදර්ශී සමාජයත් සැබෑ සමාජයත් අතර පරතරයේ විසල් බව කෙටිකතාකරුවා සාකච්ඡා කර ඇති ආකාරය අපූරුය.

"..උඹ ඒ කාලෙ මගේ පස්සෙ වැටිලා සර් කිය කියා ආවට.. අද අපි දෙන්නම එකම අඩි පාරෙ බං" ගුරුවරයා සියදිවි නසාගන්නට පෙර නීතිවිරෝධී මත්පැන් විකුණන සිය පැරණි ගෝලයාට කියන මේ වැකියෙන් සමස්ථ නිර්මාණයේම අර්ථය නිරූපනය කෙරෙන්නේ යයි සිතෙයි.

"එතෙරවීම - ගල් වූ තරුණයකුගේ කතාවක්" ඕසට්‍රේලියාවට අධ්‍යාපනය සඳහා පැමිණ අනවසරයෙන් නවතින්නට උත්සාහ ගන්නා තරුණයකුගේ කතාවකි. ආණ්ඩුවේ නීති රීති වලට හොරෙන් කීයක් හෝ සොයා ගැනීමේ සටනක නිරතව සිටින තරුණයා ජීවිතය ගැට ගසා ගන්නට දරන උත්සාහය දෙස කෙටිකතාකරුවා හෙලන බැල්ම අපේ සිතේ විසල් කම්පනයක් ඇති කරන බවක් නොදැනෙයි. එසේ වන්නේ අප එදිනෙදා නිරීක්ෂණය කරමින් සිටින ඒ අද්දැකීම් වල සුලබ බව නිසා විය හැකිය.

කැළණි ගඟෙන් රන් මතුවූ කතාවක් පසුගියදා අපි ඇසුවෙමු. මාධ්‍ය විසින් උත්කර්ශයට නැංවූ මේ රන් හමුවීමේ කතාව දේශපාලකයන් ප්‍රයෝජනයට ගත්තේ මහජනයා කෙටි කලකට හෝ දැවෙන ප්‍රශ්න වලින් ඈත් කර සිහින ලෝක වල රැඳවීම සඳහාය.රට පුරා මහා ආන්දෝලනයක් ඇති කළ ඒ කතාව ඔස්සේ ලක්ෂ්මන් ගොඩනගන "සිහින විකිණීමට තිබේ" අපූරු නිර්මාණයකි.

කාලයෙන් කාලයම මහජන අවධානය රටේ මූලික ප්‍රශ්න වලින් ඈත් කර තැබීමට විවිධාකාර ඇස්බැන්දුම් පාලකයනට අවශ්‍යය. ග්‍රීස් යක්කුන්ගේ සිට සර්වඥ ධාතු ප්‍රදර්ශන දක්වා මේ ඇස්බැන්දුම් විකාශනය වෙයි. කැළණි ගඟෙන් රන් මතුවීමේ කතාවද මේ ප්‍රෝඩාවෙන් ඔබ්බට ගිය කතාවක් නොවේ. මේ ප්‍රෝඩාකාරී යාන්ත්‍රණයට රැවටෙන් නූගත් මහජනයාගේ ජීවිත සූරාකන්නට පාලකයෝ සමත්හුය. මේ ඒ බෙදවාදකයේ තවත් එක් පැතිකඩකි.

කුලී වැඩ කරමින් සිටින සුමනදාස ඒ වැඩ අත්හැර ගඟේ රන් සෙවීමට බසියි. ඔහු රන් සොයාගැනීමේ සිහිනයෙන් වෙලී සිටියදී දරුපැටවුන් සිටින්නේ කුගින්නේය. සුමනපාලගේ බිරිඳ වන වසන්තිගේ කනකර අබරණ පවා උකසට සින්න වෙයි. සුමනපාල රන් සොයා ගැනීමේ සිහිනයේ වෙලෙද්දී වසන්ති සිය දරුවන්ගේ කුසගින්න නිවීම සඳහා ගණිකාවෘත්තියට පිවිසෙයි.

"ඒකි එහෙම කළේ පයින්ම ගිහිල්ලා පාලමකින් එගොඩ වෙලා.. ගඟට පැනලා නෙවෙයි.. ඒක එහෙම වෙන්නෙ කොහොමද? මටත් නොකියා හොර රහසෙ ඒකිගෙ රත්තරන් ඇගෙන් සතුටුවෙන්න රත්තරන් ජීවිත ගෙවන අමනයෝ ඒකිව හොයාගෙන එනවා. රත්තරන් ගොඩක් එක්ක හීන දැක දැක හිටිය මං ගාව දැන් ඉන්නෙ මං විතරමයි. ඉතුරු වුණේ හීන විතරමද?" සුමනදාස අසයි.

අනාථ නිවාසයක දිවි ගෙවන තරුණියක වන කුමාරි දුරු රටක වෙසෙන වයස්ගත පුද්ගලයකු හා සරණ යාමෙන් පසු මුහුණ දෙන ජීවිතය නිරූපණය කරන්නට ලක්ෂ්මන් ගෙන ඇති උත්සාහයකි "නිරුවතක් නැති රුවක්" කෙටිකතාව. අසංග ගේ පළමු බිරිය මියගොස්ය. ඔහු ජීවත්වන්නේ ඇය පිළිබඳ මතකය සමගින්ය. ඉතා දැඩිව සිය පළමු බිරිය හා බැඳී සිටින අසංග කුමාරි විවාහ කර ගැනීම සාධාරණීකරණය කරන්නට ලේඛකයාට හැකිවී තිබේද යන පැනය අපේ සිතට නැගෙයි.

වර්තමානය ඉතා දැඩි ලෙස දේශපාලකයන්ගේ ග්‍රහණයට හසුව තිබෙයි. ජීවත්වීමේ සියලු අවශ්‍යතා මත වැටී තිබෙන දේශපාලක සෙවණැල්ල සමාජයට කරමින් තිබෙන විනාශය අති විශාලය. රිසි ලෙස සිය කාමසුබල්ලිකානු දිවි පැවත්ම පවත්වාගෙන යන්නට අවශ්‍ය පරිසරය දේශපාලකයන් වෙනුවෙන් සකස් කෙරී ඇත. බලය සහ ධනයද උන් අතය. නීතියද යුක්තියද උන්ගේය. මේ ජරා පීර්ණ දේශපාලකයන් අතින් සිදුවන දහසකුත් එකක් වැරදි කාලයේ වැලි තලාව යටම සැඟවී යනු විනා ඒ වෙනුවෙන් කෙඳිරිල්ලක් හො නොනැගෙයි. ලක්ෂ්මන් සිය "මනාපය" කෙටි කතාවෙන් කියන්නට උත්සාහ ගන්නේ මේ ජරාපීර්ණ සමාජ ක්‍රමයේම කතාවකි. දේශපාලකයකුට දාව දුප්පත් කාන්තාවක බිහි කර ඇති දැඩි කරන දරුවා දේහපාලකයා මනාපය ඉල්ලා අලවා ඇති පෝස්ටරයකින් ඔහුගේ රුව ඉරාගෙන ගොස් ගෙදර අලවා ගන්නේ මේ මගේ තාත්තා යයි කියමිනි. ඉන්පසුව සිවුන සිදුවීම මාලාව ලේඛකයා නිර්මාණය කරන්නේ වර්තමාන සමාජයේ නියම ස්වරූපය මේ යයි නිසි ලෙස පෙන්වා දෙමින් ය.

"හුස්ම" කෙටි කතා සංග්‍රහයේ අපට හමුවන්නේ අපේ සමාජයේ අප දන්නා හඳුනන අපට මුණ ගසෙන මිනිසුන්ය. ගැහැනුන් ය. ඔවුහු කතුවරයා විසින් බිහි කරන ලද ව්‍යාජ චරිත නොවෙති. ලෙයින් මසින් පිරි, ජීවිතයේ අති මහත් හැල හැප්පීම් වලට මුහුණ දෙමින් දිවි ගෙවනා දහසකුත් එකක් චරිත එක්තැන් කර ලක්ෂ්මන් මේ නිර්මාණය කරන්නේ අපේ සමාජයේ සැබෑ පැතිකඩකි. ඒ තුළ අපට සිතන්නට බොහෝ දෑ ඔහු ඉතිරි කර තබයි.

ලක්ෂ්මන් කොඩිතුවක්කු සතත අභ්‍යාසය විසින් ගොඩ නගන ලද ප්‍රතිභාසම්පන්න ලේඛකයෙකි. කෙටි කතා කරුවකු ලෙස ඔහු පෙන්වන ප්‍රතිභාව සැබැවින්ම අගය කළ යුතුය. තමා මේ ක්ෂෙත්‍රයේ ඉතා ඉහළ තැනක සිටින බව ලක්ෂ්මන් "හුස්ම" කෙටි කතා සංග්‍රහයෙන් අපට පෙන්වා දෙයි. ■


## ආයෝජකයකු අවශ්‍යයි

ජනප්‍රිය රූපවාහිනී නාලිකාවක් වෙනුවෙන් කොටස් 500ක් සඳහා ගිවිසුම් ගතව නිපදවෙමින් පවතින, දැනට කොටස් 50ක් රූ ගත කර ඇති, ටෙලි නාට්‍යයක් වෙනුවෙන්, අවම රුපියල් ලක්ෂ 25ක් ආයෝජනය කළ හැකි ආයෝජකයකු අවශ්‍යයි.

ප්‍රවීණ අධ්‍යක්ෂවරයකු විසින් අධ්‍යක්ෂණය කරනු ලබන මෙම ටෙලි නාට්‍යය විකාශණය වන මුලු කාලය තුළ එක් කොටසක් සඳහා රුපියල් 2500ක් (මාසයකට රුපියල් 50000ක්) ප්‍රතිලාභ ලෙස ගෙවනු ලැබෙයි. ඒ අතර ආයෝජනය කළ මුලු මුදල මාසයකට රුපියල් 150000 බැගින් ගෙවා නිම කරන්නෙමු.

වැඩි විස්තර සඳහා + 94 71 530 6220 අමතන්න